මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය
Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone
மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம்
මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය

# මතුගම අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම් වැඩසටහන2020 -

| චිත්‍ර කලාව III | 12 ශ්‍රේණිය | කාලය : පැය 03 යි |
|---|---|---|

පහත සඳහන් "ආ" සහ "ඉ" යන කොටස් තුනෙන් ඒක් කොටසක් තෝරා ගෙන ඒම කොටසේ ඒක් මාතෘකාවක් පමණක්තෝරා ගෙන වර්ණ චිත්‍රයක් නිර්මාණය කරන්න.

**"අ" කොටස - චිත්‍ර සංරචනය**

1. ගම්බද නිවසක ශාන්ති කර්මයක් කරනු ලබන අවස්ථාවක්
2. වනන්තරයේ දිය වලක දිය බොන මුව රංචුවක්
3. විදීයේ සැරිසරන යාචකයන්
4. ගොවිතැන් කටයුතුවල නිරත ගොවියන් පිරිසක්

**"ආ" කොටස - මෝස්තර නිර්මාණය**

5. ගෙබිම සැරසීමට උචිත කලාලයක් සැලසුම් කර වර්ණ කරන්න
6. අවිධිමත් හැඩ යොදා ගනිමින් ජනෙල් රෙද්දක් සඳහා උචිත මෝස්තර නිර්මාණයක් කර වර්ණ කරන්න.
7. මල් , ගෙඩි ,කොළ භාවිතා කරමින් වීත්ත මෝස්තරයක් සඳහා ව්‍යාප්ත මෝස්තරයක් නිර්මාණය කර වර්ණ කරන්න.

**"ඉ" කොටස - ග්‍රැෆික් චිත්‍ර නිර්මාණය**

8. අපද්‍රව්‍ය වලින් තොර පරිසරයක් තේමා කර ගත් වර්ණවත් පෝස්ටරයක් නිර්මාණය කරන්න.
9. නැටුම් කලාව නමින් අළුතින් මුද්‍රණය කිරීමට අපේක්ෂිත පොතකට අර්ථාන්විත පිටකවරයක් සැලසුම් කොට වර්ණ කරන්න.
10. නව නිෂ්පාදිත "සුවඳ විලවුන්" වර්ගයක් බහාලුම සඳහා උචිත දවටනයක් සැලසුම් කර වර්ණ කරන්න.

මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்வி வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்வி வலயம்

# මතුගම අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2020 මාර්තු

| චිත්‍ර කලාව I,II | 12 ශ්‍රේණිය | කාලය : පැය 03 යි |
|---|---|---|

- උපදෙස්

මෙම ප්‍රශ්නපත්‍රය කොටස් දෙකකින් සමන්විතය.

I කොටස ප්‍රශ්න සියල්ලටම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේම සපයන්න.එක් එක් ප්‍රශ්නයට නිවැරදි පිළිතුර තෝරා එහි අංකය ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.

II කොටස අනු කොටස් 3 කින් සමන්විතය. එක් කොටසකින් එක් ප්‍රශ්නය බැගින් තෝරාගෙන ප්‍රශ්න 3 කට පිළිතුරු සපයන්න.

I කොටසට හා II කොටසට අයත් පිළිතුරුපත් එකට අමුණා භාර දෙන්න.

---

### I කොටස


- ප්‍රශ්න අංක 1 සිට 5 තෙක් ප්‍රශ්න වලට වඩාත් යෝග්‍ය පිළිතුර පහත සඳහන් A,B,C,D,E ලෙස නම් කර ඇතිකැටයම් ඇතුළත් පින්තූර ඇසුරින් තෝරන්න


A


B


C


D


E

01) A අක්ෂරයෙන් දැක්වෙන සඳකඩ පහණ කැටයම (..........)

1. අනුරාධපුර ශිල්පියාගේ නිර්මාණශීලීත්වය දැක්වෙන කැටයමකි
2. විවිධ වස්තූන් සීමිත තලයක රචනා කළ පුවරු කැටයමකි
3. කැටයම් ශිල්පියාගේ විවිධත්වය සංකල්පනාත්මකව නිර්මාණය වූවකි
4. අනුරාධපුර යුගයේ බිහිවූ කලාත්මක භාවය අතින් විශිෂ්ටතම සඳකඩ පහන් ආකෘතියයි
5. සත්ත්ව රූප හා ලියවැල් මෝස්තර සම්පිණ්ඩනය කරමින් කළ නිර්මාණයකි

02) B අක්ෂරයෙන් දැක්වෙන ගුහා සිතුවම (..........)

1. ප්‍රාග් ඓතිහාසික මානවයාගේ නිර්මාණශීලිත්වය පෙන්නුම් කරයි
2. ගවයාගේ ක්‍රියාකාරී ඉරියව් අධ්‍යයනය කිරීම තුලින් තාත්වික සංරචනයක් දැක්වීමට උත්සාහ දරා ඇත
3. පැරණි යුරෝපීය ගුහා සිතුවම් අතරින් කැපී පෙනෙන සිතුවමකි
4. යුරෝපීය ප්‍රාග් ඓතිහාසික මානවයාගේ නිර්මාණ සහිත ඇල්ටමයිරා ගුහාවේ බහුල වශයෙන් දැකිය හැකි බයිසන් ගවරුවකි
5. වසර 30,000 තරම් පැරණි ලෙන් ආශ්‍රිතව දැකිය හැකි නිර්මාණයකි

03) C අක්ෂරයෙන් දැක්වෙන්නේ (.......... )

1. චෛත්‍ය මල් ආසන සම්බන්ධ කැටයමකි
2. පුන්කලසකින් මතුවන කල්පලතා හෙවත් ජීවන වෘක්ෂ සහිත තලයකි
3. චෛත්‍ය සතර දිශාවන් දැක්වීම සඳහා යෙදූ නිර්මාණයකි
4. අමරාවතී ලක්ෂණ පිළිඹිබු වන කැටයම් සහිත වාහල්කඩ නිර්මාණයකි
5. ස්ථූප ආශ්‍රයෙන් දක්නට ලැබෙන කැටයම් සහිත නිර්මාණයකි

04) D අක්ෂරයෙන් දැක්වෙන්නේ (.......... )

1. මථුරා පිළිම අතර රාජකීයකු දැක්වෙන එකම කැටයකි
2. බුදුරුව නිර්මාණ සේම රාජකීය චරිත නෙලීමට ගන්ධාර ශිල්පීන් දැරූ උත්සාහයකි
3. ගන්ධාර ශිල්පීන් විසින් නිර්මාණය කළ තම අධිපති කණිෂ්කගේ පිළිරුව
4. මථුරා ශිල්පීන් අතින් ලියනු කණිෂ්ක රජුගේ පිළිමය
5. සරල ජ්‍යාමිතික හැඩ ඇසුරින් මථුරා ශිල්පීන් කළ නිර්මාණයකි

05) E අක්ෂරයෙන් දැක්වෙන්නේ (.......... )

1. රාජකීයකුගේ ලක්ෂණ පිළිඹිබු කරයි.
2. ඉන්දු නිම්න වැසියන් සතු ඇඹීමේ කුසලතාව පිළිඹිබු කරන්නෙකි
3. සංකේතාත්මක ප්‍රකාශනයෙන් යුතු හින්දු දෙවියෙක් නිරූපණය කරන්නෙකි
4. තාත්වික ලක්ෂණ නිරූපණය කරන්නෙකි
5. ශෛලිගත ලක්ෂණ නිරූපණය කරයි

- ප්‍රශ්න අංක 06-10 තෙක් අසා ඇති ප්‍රශ්න වලට වඩාත් නිවැරදි පිළිතුර පහත 1-7 දක්වා නම්කර ඇති පහත සඳහන් චිත්‍ර කොටස් ඇසුරු කරගෙන තෝරන්න.


1


2


3


4


5


6


7

06) මෙම සිතුවම් අතරින් පැරණිතම බෞද්ධ සිතුවම කුමක්ද ? (...............)

1. 1- 2 2. 2- 3 3. 3- 4 4. 4- 5 5. 6-7

07) මෙම සිතුවම් අතරින් ලෙන් විහාර සිතුවම් දක්නට ඇති ස්ථාන මොනවාද ? (...............)

1. 2- 3 2. 2- 1 3. 3- 6 4. 4- 4 5. 5- 2

08) මෙම සිතුවම් තුළින් ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් සිතුවම් මොනවාද ? (...............)

1. 5-6 2. 1-2-3 3. 4-2-3 4. 2-1-3 5. 4-5-6-7

09) බාහිර ගල් බිත්තියේ සිතුවම් ඇඳ ඇත්තේ? (...............)

1. 2,4,7 2. 5,6,7 3. 2,6,7 4. 5,2,1 5. 1,2,6

10) මෙම සිතුවම් අතරින් අනුරාධපුර යුගයට අයත් චිත්‍ර වන්නේ (...............)

1. 3,4,5 2. 5,6,7 3. 1,2,3 4. 3,6,7 5. 2,5,7

- ප්‍රශ්න අංක 11-15 තෙක් අසා ඇති එක් එක් ප්‍රශ්නයට නිවැරදි පිළිතුර තෝරන්න.K,L,M,N,O ලෙස නම් කර ඇති පහත සඳහන් චිත්‍ර ඇසුරින් තෝරන්න.


K


L


M


N


O

11) K සිතුවම (...............)

1. K අක්ෂරයෙන් දැක්වෙන සිතුවමේ පර්යාවලෝකන ලක්ෂණ මනාලෙස අධ්‍යනය කොට කළ නිර්මාණයකි
2. ඇතැන්ස් ගුරු කුලය රෆායෙල් විසින් පර්යාවලෝකන ලක්ෂණ යොදා ක්‍රියාකාරී මානව රූප සහිත විශිෂ්ඨ බිතුසිතුවමකි
3. මෙම සිතුවම තුළ ඇරිස්ටෝටල් හා ප්ලේටෝ යන දාර්ශනිකයන් වාදවල යෙදී සිටින අයුරු දැක්වේ.
4. විවිධ වර්ඛ රටාවන් අතර අඳුරු කහ වර්ණවල ප්‍රභේද මේ සඳහා යොදාගෙන ඇත
5. පුනර්ජීවන යුගයේ විසූ ශ්‍රේෂ්ට චිත්‍ර ශිල්පියෙකු විසින් කරන ලද සුවිශේෂී බිතු සිතුවමකි

12) L සිතුවම (...............)

1. දෙවියන් වහන්සේ වයස් ගත ස්වරූපයෙන් හා ආදම් තරුණ ස්වරූපයෙන් ඇඳ ඇත.
2. චිත්‍ර ශිල්පියාගේ මූර්තිවල දැකිය හැකි ජව සම්පන්න වූ ප්‍රතාපවත් බව මෙම සිතුවම් තුළ ද දැකිය හැක
3. මයිකල් ආන්ජලෝ විසින් රෝමයේ සිස්ටයින් දෙව් මැදුරේ පෙස්කොසිකෝ ශිල්ප ක්‍රමයට නිර්මාණය කරන ලද වියත්තල සිතුවමකි
4. මෙම සිතුවමේ සුවිශේෂී බව වන්නේ දෙවියන් වහන්සේගේ ස්වරූපය සාමාන්‍ය මිනිසෙකු ලෙස නිර්මාණය කොට දැක්වීමයි
5. මෙම චිත්‍රයෙන් දැක්වෙන්නේ දේව දූතයන් සමග සිටින දෙවියන්වහන්සේ ආදම් වෙත ඇඟිල්ල දිගු කරන අතර ආදම් විසින් දෙවියන් වහන්සේට අත දිගු කිරීමයි

13) M සිතුවම (...............)

1. මෙහි වර්ණ ගැන්වීමේ සිද්ධාන්තය කියරෝස්කුරෝ (chiaroscuro) ලෙස හැඳින්වේ
2. පර්වත මස්තකයේ දේවමෑණියෝ ලියනාඩෝ ඩාවින්චි විසින් කැන්වසය මත තෙල්සායමින් නිර්මාණය කරන ලද්දකි
3. ත්‍රිකෝණාකාර ආකෘතියක් මත රූ සම්පිණ්ඩනය කර ඇති අතර අඳුර තුළින් ආලෝකය මතුවීම පිළිබඳව ශිල්පියාගේ ඇති හැකියාව මෙම සිතුවමෙන් නිරූපණය වේ
4. දුඹුරු වර්ණයේ ප්‍රභේදවලින් සමන්විත අඳුරු වර්ණාවලියක් සහිත මෙම සිතුවමින් මරියතුමියගේ හා දරුවන්ගේ මුහුණු ආලෝකය සහිතව පෙන්වා ඇත
5. මෙම සිතුවමේ මානවරූප වලින් දේව මෑණියන්ගේ මුහුණේ කරුණා හරත බව දරුවන්ගේ මුහුණින් මොල කැටි බවත් පෙන්නුම් කිරීමට රෆායෙල් සෙන්ටියෝ උත්සහ දරා ඇත

14) N සිතුවම (...............)

1.මාර පරාජය දැක්වෙන මෙම සිතුවම සෝමබන්දු විද්‍යාපති ශිල්පියා විසින් ඇඳි බෙල්ලන්විල විහාරයේ සිතුවමකි

2.බුදුන්වහන්සේගේ ලංකාගමනය පිළිබඳ පුවතක් මනා සම්පිණ්ඩනයකින් යුක්තව ප්‍රකාශ කර ඇත

3. ක්‍රියාකාරී මානව ඉරියව් හා විවිධ චරිත ලක්ෂණ අපූර්වාකාරයෙන් සම්පිණ්ඩනය කර දක්වා ඇත

4. සෝලියස් මෙන්ඩිස් මහතා විසින් කැළණි විහාරයේ බිතු සිතුවම් කලාවේ විප්ලවීය පරිවර්තනයක් ඇති කරලමින් කල සිතුවමකි

5. යක්ෂයින්ගේ දරදඬුබව, බියකරු බව හා බුදුන් වහන්සේගේ උපශාන්ත බව මෙන්ම මනා සංයමය පිළිඹිබු කරයි

15) O සිතුවම (...............)

1.අඳුර තුලින් ආලෝකය වඩාත් තීව්‍ර ලෙස මතුකරන කියුරෝස්කුරෝ නැමැති වර්ණ කිරීමට සමාන ලක්ෂණ මෙම සිතුවම තුලින් දැකිය හැක

2.පැරණි සම්ප්‍රදායික චිත්‍ර කලාවේ රිද්මයානුකූල රේඛාව නව ජීවයක් එක්කරමින් සම්ප්‍රදායික සංගත වර්ණමාලාවක් අනුව නිර්මාණය කර ඇත


3. මෙම සිතුවමින් දැක්වෙන රුවල් නැව විස්තරාත්මක හැඩතලවලින් සියුම් රේඛාවන්ගෙන් විචිත්‍රවත්ව දක්වා ඇත

4. සෝලියස් මෙන්ඩිස් නව කැළණි විහාරයේ ඇඳි මෙම සිතුවමින් සංඝමිත්තා තෙරණිය විසින් ශ්‍රී මහා බෝධි දක්ෂිණ ශාඛාව ලංකාවට රැගෙන ඒම නිරූපණය වේ.

5. විශාල තලයක් මත සිතුවම සම්පිණ්ඩනය කිරීමේදී ඇතිවන අභියෝගය ජය ගනිමින් ශිල්පීය හැකියාව වර්ණ ,රේඛා සහ සංරචනය මගින් ප්‍රකාශනයක් සිදුකොට ඇත

- ප්‍රශ්න අංක 16-20 තෙක් අසා ඇති එක් එක් ප්‍රශ්නයට වඩාත් නිවැරදි පිළිතුර පහත සඳහන් F,G,H,I,J ලෙස නම් කර ඇති නිර්මාණ තුලින් තෝරන්න.


F


G


H


I


J

16) F ඇසුරින් දැක්වෙන්නේ (...............)

1. කුළුණු ශීර්ෂය අඩක් පිපුණු නෙළුමක ස්වරූපයට සමානව නිර්මාණය කොට ඇත

2. පොලොන්නරු යුගයට අයත් නිශ්ශංකමලුල රජු විසින් නිර්මාණය කළ නිශ්ශංක ලතා මණ්ඩපයේ නෙළුම් දණ්ඩක හැඩය ගත් ගල් කණුය

3. 12 වන සියවසට අයත් ලක්දිව ගෘහ නිර්මාණ ශිල්පයේ සුවිශේෂී නිර්මාණයක් ලෙස නිශ්ශංකලතා මණ්ඩපය හැඳින්විය හැක

4. නිශ්ශංකමල්ල රජු විසින් ධර්මය සහ පිරිත් ශ්‍රවණය කිරීමට මෙම ගෘහය නිර්මාණය කොට ඇත

5. අඩි 07 ක් පමණ උස නෙළුම් දණ්ඩක හැඩය ඇති ගල් කණු ආකෘතියක් මෙයින් නිරූපණය වේ

17) G අකුරින් දැක්වෙන්නේ (...............)

1. පොළොන්නරුව ආලාහ පිරිවෙන් භූමියේ බටහිර පෙදෙසේ පිහිටා ඇති ගඩොලින් කරන ලද ස්ථූපයකි
2. මෙම ස්ථූපයේ සතර දිශාවේ අලංකාර මල් ලියකම් වලින් සමන්විත වාහල්කඩ 4 ක් දැකිය හැක
3. චෛත්‍ය අටකොනේ පිළිම ගෙවල් 8ක් දැකිය හැකි අතර ස්ථූපයේ උස අඩි 200 කි
4. පොලොන්නරු යුගයට අයත් බුබ්බුලාකාර හැඩයෙන් යුත් නිශ්ශංක මල්ල රජු විසින් නිර්මාණය කළ රන්කොත් වෙහෙරයි
5. මෙම රන්කොත් වෙහෙර කාලිංගමාඝ ආක්‍රමණයෙන් විනාශ වූ අතර වර්තමානයේ පවා ගිණි තැබීමෙන් විනාශ වූ ලක්ෂණ දක්නට ඇත

18) H අක්ෂරයෙන් දැක්වෙන්නේ (...............)

1. ඉන්දු නිම්ම ශිෂ්ටාචාරයෙන් හමු වූ රතු වැලිගලින් නිර්මාණය කළ නළගන රූපය මෙයින් දැක්වේ
2. ඉන්දු නිම්නයෙන් හමුවූ නලගන රුව නම් මෙම මූර්තියේ වම් අතේ ඉහල සිට පහළට එකිනෙක ගැවෙන පරිදි වළලු පළඳා ඇත
3. ලෝකඩ මාධ්‍යයෙන් නිර්මාණය කළ මෙය නළගන රුව ලෙස හඳුන්වන අතර උස අගල් 4 ½ කි
4. කෙසඟ සිරුරක් ආකාරයෙන් දක්වා ඇති මෙය ඉන්දු නිම්නයෙන් හමු වූ නග්න කාන්තා රුවකි
5. මෙම මූර්තියේ එකල ඉන්දු නිම්න වැසියන්ගේ ආභරණ හා පලඳනා පිළිබඳව අවබෝධයක් ලබා ගත හැක

19) I අක්ෂරයෙන් දැක්වෙන්නේ (...............)

1. සාංචි ස්ථූපයේ සතර දිශාවවට ම මුහුණලා ඉදිකළ තොරණ සතරෙන් එක් තොරණකි
2. අශෝක රජු විසින් ඉදිකල සාංචි ස්ථූපයේ දැකිය හැකි අල්ප උන්නත කැටයම් සහිත කොටසක් වන අතර කැටයම් සංග යුගයට අයත්ය
3. බුද්ධ චරිතයේ වැදගත් සිදුවීම් සහ ජාතක කථා මෙම තොරණේ ගලජ් කැටයම්වලට තේමාවී ඇත.
4. මෙම කැටයම් වල බුද්ධ රූපය වෙනුවට ධර්මචක්‍රය මඟුල් කඩුව සමස්ථ බෝධි වෘක්ෂය සිරිපතුල වැනි සංකේත යොදාගෙන ඇත
5. මෞර යුගයට අයත් සාංචි තොරණේ කැටයම් අඛණ්ඩ කථන ක්‍රමයට සිරස් අතරට බෙදාගත් ජනේල වල අල්ප උත්ත ආකාරයෙන් කැටයම් කොට ඇත

20) J අක්ෂරයෙන් දැක්වෙන්නේ (...............)

1. මිසර ශිෂ්ටාචාරයේ හමුවන ලක්සෝර ඊජිප්තු දේවස්ථානයයි
2. නයිල් නදී ඉවුරේ දෙවියන් වෙනුවෙන් ගඩොලින් කල දේවස්ථානයකි
3. රමෙසන් රජු විසින් නයිල් ගංගාධාරයේ ඉදිකළ දේවස්ථානයකි
4. මිස ශිෂ්ටාචාරයේ හමුවන අබුසිම්බල් දේවස්ථානය වේ
5. මධ්‍ය රාජධානි යුගයේ මිසරයේ ඉදිකල දේවස්ථානයකි

- ප්‍රශ්න අංක 21-25 තෙක් ප්‍රශ්න වල වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.

21) නිශ්පාදිත භාණ්ඩයක් හඳුන්වා දීම සඳහා නිර්මාණය කෙරෙන පෝස්ටරයක වඩා වැදගත් වන්නේ, (...............)

1. රූප හා වර්ණ සංකේතාත්මකව භාවිතා කිරීමයි
2. තේමාවට ගැලපෙන කෙටි පාඨයක් භාවිතා කිරීමයි
3. අරමුණ සරලව, නිරවුල්ව ,අර්ථාන්විතව හා වේගවත්ව ප්‍රකාශ කිරීමයි
4. සංකේත රූපසටහන් තලය හා අවකාශයට ගැලපෙන සේ සැලසුම් කිරීම
5. මනා නිමාවකින් හා විචිත්‍රවත්ව නිර්මාණය කිරීමයි

22) චිත්‍ර ශිල්පියෙකු සිතුවමක් වර්ණ ගැන්වීමේදී අවධාරණය කරනුයේ (...............)

1. චිත්‍රයේ සිත්තම් බවය
2. තේමාව මතු කර දැක්වීම
3. ශිල්ප ක්‍රම භාවිතයයි
4. තමාට අවේණික ශෛලියයි
5. වස්තූන්ගේ ස්වභාවයත් පෙන්වීමයි

23) ආදම් මැවීම සිතුවම නිර්මාණය කළ චිත්‍ර ශිල්පියා වන්නේ (...............)

1. මයිකල් ආන්ජලෝ
2. පෝල් සෙසැන්
3. ලියනාඩෝ ඩාවින්චි
4. රෆායෙල් සැන්ටි
5. පැබ්ලෝ පිකාසෝ

24) ලංකා කලා සංගමයේ ශිල්පීන්ගේ අරමුණ වූයේ (...............)


1. සම්භාව්‍ය ශාස්ත්‍රාලීය චිත්‍ර කලාව ප්‍රචලිත කරලීම
2. තත්කාලීන බටහිර ශිල්පීන්ගේ ක්‍රම ශිල්ප මෙරටට හඳුන්වාදීමයි
3. ස්වාධීනව නව නිර්මාණ බිහි කිරීම හා චිත්‍ර කලාවට නව අරුතක් දීමයි
4. සම්ප්‍රදාය රකිමින් සිද්ධාන්ත මත පිහිටා සිතුවම් කිරීමට ඉඩ සැලසීමයි
5. නවක ශිල්පීන් දේශීය චිත්‍ර කලාවට නැඹුරු කිරීමයි

25. පොළොන්නරුවේ හමුවන අංක 02 ශිවදේවාලය (...............)

1. පොලොන්නරුවේ හමුවන ප්‍රථම ශිව දේවාලයයි
2. දකුණ ඉන්දියානු ගෘහ නිර්මාණ ක්‍රම අනුව ඉදිවූවකි
3. පාණ්ඩ්‍ය ගෘහ නිරුමාණ ශිල්පීය ක්‍රම අනුව 12 වන සියවසේ ඉදිවූවකි
4. එකොලොස්වවන සියවසේ රාජේන්ද්‍ර චෝලගේ පාලන සමයේ ඉදිවූවකි
5. දකුණු ඉන්දියානු විජය නගර් ගෘහ නිර්මාණ ක්‍රමය අනුව ඉදිවූවකි

- ප්‍රශ්න අංක 26-30 තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට ඊට ඉදිරියෙන් ඇති වාස්තු විද්‍යා නිර්මාණ ඇසුරෙන් වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න

26) මෙහි දැක්වෙන ස්තූපය වන්නේ (...............)



1. ථූපාරාමය
2. රුවන්වැලි මහා සෑය
3. අභයගිරිය
4. ජේතවන දාගැබ
5. කිරි වෙහෙර

27) මෙහි දැක්වෙන වටදාගෙය (...............)




1. ශ්‍රී ලංකාවේ වටදාගෙවල්වලින් විසිතුරුම වටදාගෙයයි
2. නිශ්ශංකමල්ල රජු විසින් ප්‍රතිසංස්කරණය කරන ලද වටදාගෙයකි
3. සිව්වන අක්බෝ රජු විසින් 7 වන සියවසේ මැදිරිගිරිය ග්‍රාමයේ ඉදිකරනු ලැබූ වටදාගෙයකි
4. වෘත්තාකාර ශෛලමය මලුවක් මත ඉදිකල එකම වටදාගෙය
5. මහසෙන් රජු විසින් අනුරාධපුර පූජා භූමියතුල ඉදිකල වටදාගෙයකි

28) මෙම රූපයෙන් දැක්වෙන්නේ (...............)



1. ග්‍රීසියේ ක්‍රිස්තියානි දේවස්ථානයයි
2. ග්‍රීසියේ හමුවන අයොනික් සම්ප්‍රදායේ මැදුරකි
3. ඩොරික් සැලනික් අලංකාර වූ පාතියන් දේවස්ථානයයි
4. සුවිසල් කුළුණු මත ඉදිවූ පැරණි ග්‍රීක දේවාලයකි
5. මධ්‍ය රාජධානි යුගයේ දී මිසරයේ ඉදිකල දේවාලයකි

29) මෙහි දැක්වෙන බුදු පිළිමය (...............)



1.හෝර්ට් මන්දාර් බුදු පිළිමය
2. බ්‍රෙගම් බුදු පිළිමය
3. තක්තිබහිර් පිළිමය
4. සහරි බහ්තලොල් පිළිමය
5. කත්‍රා බුදු පිළිමය

30) ඉදිරියේ දැක්වෙන ගෘහ නිර්මාණය (...............)



1. ටජ්මහලයි
2. රෝම කොලොසියමයි
3. හුමායන් සමාධියයි
4. අක්බාර් මාලිගයයි
5. සාජාහන් මාලිගයයි

- ප්‍රශ්න අංක 31 සිට 35 දක්වා එක් එක් ප්‍රශ්නයට වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.

31) ශ්‍රී ලංකාවේ හා යුරෝපයේ ප්‍රාග් ඓතිහාසික ලෙන් සිතුවම් සැසඳීමේදී යුරෝපයේ ලෙන් සිතුවම් නිර්මාණය පිළිබඳව විශේෂත්වය වන්නේ (...............)

1. අසීමිත සංඛ්‍යාවක් වර්ණ භාවිතයයි
2. විවිධාකාරවූ රූප සම්පිණ්ඩනය කර තිබීමයි
3. රූපවල හැඩතල ප්‍රාථමික ස්වරූපයක් ගැනීමය
4. ස්වභාවික හා තාත්වික ස්වරූපයට සමීප වීම
5. අඳුරු ගුහා තුල සිතුවම්කොට තිබීමයි

32) අනුරාධපුර යුගයේ සිතුවම් දැකිය හැකි ස්ථාන වනුයේ (...............)

1. සීගිරිය, හිඳගල, ගොහාගොල්ල, මහියංගන ධාතු ගර්භය
2. පොලොන්නරුව, දීඝවාපිය, මුතියංගනය
3. මහනුවර, මාතර, පොලොන්නරුව, මැදිරිගිරිය
4. විජයෝත්පාය, නිශ්ශංකලතා මණ්ඩපය, ලංකාතිලක පිළිමගෙය
5. තංතිරිමලේ, බිල්ලෑව, දොරවසාලෙන, වෙට්ටම්බුගල

33) පුනර්ජීවන යුගයේ සිටි චිත්‍ර ශිල්පීන් අතර මූර්තිකලාවේ විශිෂ්ටයෙකු ලෙස ප්‍රකට වූයේ (...............)

1. ලියනාඩෝ ඩාවින්චි
2. මයිකල් ආන්ජලෝ
3. රෆායෙල් සාන්ත්සියෝ
4. සාන්ද්‍රෝ බොත්තිසෙල්ලි
5. පියරාදෙල්ලා පැන්සිස්කා


34) සාංචිතොරණේ බහුලව දැකිය හැකි නිරූපිත කැටයම වන්නේ (...............)

1. බුද්ධ චරිතය හා ජාතක කථායොදා කල සිද්ධීන්
2. බුද්ධ චරිතයෙ සිද්ධීන්
3. ඓතිහාසික සිද්ධීන්
4. මානවරූප බහුලව යොදාකළ සිද්ධීන්
5. බෝසතුන් හා සතුන් ජාතක කථා සිදුවීම්

35) මිසරයේ නව රාංධානි යුගයේ මූර්ති තුලින් බෙහෙවින් කැපී පෙනෙනුයේ (...............)

1. සාම්ප්‍රදායික හා ස්වභාවික ලක්ෂණ සමව යෙදීම
2. සාම්ප්‍රදායික ලක්ෂණ බහුලව යෙදීම
3. ස්වභාවික ලක්ෂණ වඩාත් ඉස්මතුකර ලීම
4. සාම්ප්‍රදායික ලක්ෂණ නොසලකා හැරීම
5. පාරාවරුන්ගේ තේජෝවල මහිමය ප්‍රකට කරලීම

- ප්‍රශ්න අංක 36 සිට 40 තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට වඩාත් නිවැරදි පිළිතුර පහත සඳහන් චිත්‍රය ඇසුරෙන් තෝරන්න.



36) මෙම සිතුවම උපුටාගන්නා ලද්දේ (...............)

1. කැලණි විහාරයෙනි
2. බොරුල්ල ගෝතමී විහාරයෙනි
3. බෙල්ලන්විල විහාරයෙනි
4. මාලිගාකන්ද විහාරයෙනි
5. සේදවත්ත විහාරයෙනි

37) මෙම සිතුවම නිර්මාණය කරන ලද්දේ (...............)

1. විදේශීය ආභාසය මත සිතුවම්කරණයේ යෙදුනු ඇම්.සාර්ලිස් ශිල්පියායි
2. දේශීය සම්ප්‍රදායන් ගරුකළ සෝලියස් මෙන්දිස් ශිල්පියාය
3. විහාර චිත්‍ර කලාව නව මගකට යොමු කළ ජෝර්ජ් කීට් ශිල්පියාය
4. නව ආරක චිත්‍ර සම්ප්‍රදායන් ගොඩනගාගත් සෝමබන්ධු විද්‍යාපති ශිල්පියාය
5. විහාර චිත්‍ර කලාවට දායක වූ මංජු ශ්‍රී විසිනි

38) මෙම සිතුවමින් නිරූපණය වන්නේ බුද්ධ චරිතයේ කිනම් අවස්ථාවන්ද ? (...............)

1.බුදුන්වහන්සේ සියලු යක්ෂ භූතයින් දිවයිනෙන් පලවා හැරීම
2. නව කැලණි විහාරයේ සෝලියස් මැන්දිස් මහතාගේ මහියංගනයට වැඩම කිරීම සිතුවම
3. බුදුන් වහන්සේ කිඹුල්වත් පුරයට වැඩමවා නෑයන්ගේ මානය බිඳීමට යමාමහ පෙළහර පෑම සිතුවම
4. සෝමබන්දු විද්‍යාපති ගේ බෙල්ලන්විල විහාරයේ මාරබරාජය සිතුවම
5. එම් සාර්ලිස් මහතාගේ මාර පරාජය සිතුවමයි

39) මෙම සිතුවම තුළින ශිල්පියා (...............)

1. මානව රුවේ හා වස්තුන්ගේ ස්වභාවික ආකෘතිය තත්වාකාරයෙන් භාවිතයට ගෙන ඇත
2. ස්වභාවික මානව රුවේ මූලාකෘතිය කිසියම් ශෛලියකට අනුව හසුරුවා ඇත
3. ප්‍රකාශනයේ ආකෘතිය රංග කලාවේ මූලික ඉරියව්වලට අනුව හසුරුවා ඇත
4. සජීවී වස්තුන්ගේ චලන ශෛලිගත සම්ප්‍රදායකට අනුව හසුරුවා ඇත
5. මානව රුව නිවැරදි මාන ප්‍රමාණයන්ගෙන් යුතුව රචනා කර ඇත

40) මෙම සිතුවම පිළිබඳ වඩාත්ම ගැලපෙන ප්‍රකාශය කුමක්ද ? (...............)

1. මනා සංයමයෙන් යුතුව කර ඇති රූප හා වර්ණ භාවිතය අතිශයින්ම භාවාත්මකය
2. හැඟීම් ප්‍රකාශය කෙරෙහි මහත් වෙහෙසක් දරා ඇත
3. සංරචනය තුළින් තේමාවට සාධාරණයක් ඉටු කර ඇත
4. විහාර චිත්‍ර කලාවට උචිත නව චිත්‍ර ආරක් හඳුන්වාදීමට සමත්ව ඇත
5. ආගමික තේමාවකට ගැලපෙන වර්ණ රටාවක් භාවිත කොට ඇත

## II කොටස

- ❖ මෙම කොටස අනු කොටස් තුනකින් සමන්විතය
- ❖ එක් කොටසකින් එක් ප්‍රශ්නය බැගින් තෝරාගෙන ප්‍රශ්න තුනකට පිලිතුරු සපන්න.

**(අනවශ්‍ය තැන්හි පිලිතුරු සචිත්‍ර කිරීම ඔබට වාසිදායක වේ)**

### අ කොටස
### (චිත්‍ර කලාව ඇගයීම හා රසාස්වාදය - ශ්‍රී ලංකාව)

01) ශ්‍රී ලංකාවේ පැරණි මානවයාගේ සිතුවම් තුලින් ඔවුන්ගේ පැවති කලා රසඥතාවය පිළිබද අදහස් ලබා ගත හැක

i. ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික සිතුවම් හමුවන ස්ථාන 04 ක් නම් කරන්න.

ii. දුනුවායා ,සතකු පිට යන මිනිසා වැනි සිතුවම් හමුවූ ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික ස්ථාන නම්කර එම සිතුවම් වල ශිල්පීය ලක්ෂණ ගැන කෙටි විස්තරයක් කරන්න.

iii. වෙට්ටුම්ගල නම් ස්ථානයෙන් හමුවුන සිතුවම් 03 ක් නම් කර ඒවායේ ශිල්පීය ලක්ෂණ ගැන විස්තරයක් කරන්න.

02) අනුරාධපුර යුගය අවසන්වන විට විශාල ප්‍රමාණයේ ස්ථූප නිර්මාණය වූ අතර පොලොන්නරු යුගයේ ද විශාල ස්ථූප නිර්මාණය කිරීමට උත්සාහ ගෙන ඇති බව දෙමළ මහා සෑය ස්ථූපය අධ්‍යයනය කිරීමෙන් පැහැදිලි වේ.

i. ශ්‍රී ලංකාවේ පළමු ඓතිහාසික ස්ථූපය හා මහා දාගැබ් ත්‍රිත්වය නම් කරන්න.

ii. ස්ථූපය හා සම්බන්ධ කලා නිර්මාණ සහ ගෘහ නිර්මාණ අංග ගැන කෙටි විස්තරයක් කරන්න.

iii.ශ්‍රී ලංකාවේ ස්ථූප ආරම්භය හා විකාශනය සඳහා ඉන්දියානු සාංචි ස්ථූපයේ ආභාසය කෙතරම් දුරට බලපෑවේද යන්න උදාහරණ සහිතව විස්තර කරන්න.

### ආ කොටස
### චිත්‍රකලාව ඇගයීම හා රසාස්වාදය - ඉන්දියාව

03) ක්‍රි.පූ.3000 දී පමණ ඉන්දු නදිය ආශ්‍රය කරගෙන මොහොන්ජොදාරෝ හා හරප්පා නගර කේන්ද්‍ර කර ගිනිමන් ඉන්දු නිම්න ශිෂ්ටාචාරය බිහි විය.

i. ඉන්දු නිම්නයේ නගර නිර්මාණය සහ වාස්තු විද්‍යාත්මක ගොඩනැගිලිවල සුවිශේෂී ලක්ෂණ උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

ii. මෙම ශිෂ්ටාචාරයෙන් හමු වූ ප්‍රධාන කලා කෘති 04 ක් නම් කරන්න.

iii.මුද්‍රා සඳහා යොදාගත් සංකේත දෙකක් නම්කර ආගමික ඇදහිලි සඳහා යොදාගත් දෙවිවරුන් පිලිබද විස්තරයක් කරන්න.

04) මෞර යුගයේ ඇරඹි බෞද්ධ කලාව පසු කාලීනව සමස්ථ ඉන්දියානු කලාව කෙරෙහිම ප්‍රබල බලපෑමක් කිරීමට සමත් විය

i. මෞර යුගයේ ඉදිවූ බෞදධ ස්ථාන 02 ක් නම් කරන්න.

ii. මෞර ශිල්පියා චෛත්‍ය වටා ඉදිකල ගල්වැටි නිර්මාණ ආකෘතිය පහදන්න.

iii.සාංචි තොරණේ කැටයම් ශිල්පියා බුද්ධ චරිතයේ සිදුවීම් මෙන්ම ජාතක කථා ද තම නිර්මාණ සඳහා පාදක කර ගනු ලැබීය. මේවායේ කලා ලක්ෂණ උදාහරණ සහිතව විස්තර කරන්න.

05) ක්‍රි.පූ.40,000-10,000 අතර ජීවත් වූ මානවයාගේ ලෙන් ආශ්‍රිත සිතුවම් ප්‍රංශයේ හා ස්පාඤ්ඤයේ විවිධ ප්‍රදේශවල හමුවේ.

i. යුරෝපයේ ප්‍රාග් ඓතිහාසික සිතුවම් හමුවන ස්ථාන 04ක් නම් කරන්න.

ii. අඩි 17 ක් දිග බයිසන් ගවරුව හා අඩි 15 ක් දිග බයිසන් ගවරු 05 ක් හමුවුණ ලෙන නම් කර එම සිතුවම පිළිබඳ විස්තරයක් කරන්න.

iii. ලෙන් සිතුවම් කලාවේ පරමාර්ථ කෙබඳුදැයි විස්තර කරන්න.

06) ක්‍රි.පූ.3000 දී පමණ නයිල් නදිය ආශ්‍රිතව ඇරඹුණ මිසර ශිෂ්ටාචාරයේ අභිමාණය හා තේජෝබල පරාක්‍රමය ලොවට කියාපාන කලා නිර්මාණ රැසක් නයිල් මිටියාවතේ දක්නට ඇත.

i. ආරම්භයේදී මල සිරුරු මිහිදන් කළ මිසර වැසියෝ පසුව මල සිරුරු තැන්පත් කිරීම සඳහා යොදාගත් වාස්තු විද්‍යාත්මක නිර්මාණ 04 ක් නම් කරන්න.

ii. මිසර සොහොන් ගෙවල් චිත්‍ර මූර්ති නිර්මාණ ඇසුරින් අලංකාර කරනු ලැබීය.ඊට හේතු වූ කරුණු සැකෙවින් පැහැදිලි කරන්න.

iii.මිසර ගෘහ නිර්මාණ කලාවේ අභිමානය හා මහෙසාක්‍ය බව ඔවුන් ඉදිකල දේවස්ථාන තුලින් පිළිඹිබු වේ. කානෙක් ගෘහ නිර්මාණ ලක්ෂණ ඇසුරින් මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න.